# පළාත් පාලන මැතිවරණ ක්‍රමය සඳහා යෝජිත වෙනස්කම් පිළිබඳ සටහනක්

සාධාරණ සමාජයක් සඳහාවූ ජාතික ව්‍යාපාරය වෙනුවෙන් ආචාර්ය සුජාතා ගමගේ **විසින් සම්පාදිතය.**
gamage@gmail.com; +94 77 774 8470
2020 මැයි 15

පසුගිය 2020 මාර්තු මාසයේදී මැතිවරණ ප්‍රතිසංස්කරණ සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කර දෙවනුව එම කාරක සභාවේ සහාය සඳහා තාක්ෂණික කමිටුවක්ද පත් කරන ලදී. අපට ලැබී ඇති ආරංචි වලට අනුව කාරක සභාවේ සම්මුතිය ලෙස එම තාක්ෂණික කමිටුව විසින් අර්ථකථනය කර ඇත්තේ පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණ ක්‍රම දැනට පරිදිම පවත්වා ගැනීමත්**,** පළාත් පාලන ආයතන වල මැතිවරණ ක්‍රමය සඳහා සඳහා කඩිනම් විසඳුම් ලබා දීමත්ය.

තව දුරටත් ඔවුන් විසින් දැනට පවතින මිශ්‍ර මන්ත්‍රී පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳව ප්‍රධාන ප්‍රශ්න දෙකක් හඳුනා ගෙන ඇත. එනම් එම මැතිවරණයේ මන්ත්‍රී ධූර ගණන 2013 දී පෙර තිබූ 4386 සිට 8719 ක් දක්වා වැඩි වීම, සහ 'දිනන' පක්ෂයට සභාවේ ආසන බහුතරයක් නොලැබීමයි. ප්‍රශ්නය වන්නේ එම ප්‍රශ්න දෙක ඇත්තෙන්ම මැතිවරණ ක්‍රමයේ ප්‍රශ්න නොවීමය..

දෙවනුව, විසඳුම් ලෙස තාක්ෂණික කමිටුව හෝ එහි සභාපති මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා යෝජනා කරන්නේ "මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වා දුන් **2017** පළාත් පාලන මැතිවරණ පනත දිගටම පවත්වාගෙන යෑම" යන්න නමුත් එම **2017** පනතේ අපේක්ෂිත සමානුපාතික නියෝජනයට කුළු පහර එල්ල කරමින් කේවල ප්‍රතිඵල වලට වැඩි බරක් දීමේ යෝජනා කිහිපයක්ද එම සම්මුතියට එකතු කර ඇත. එනම්:

- පළාත් පාලන ආයතන සඳහා 2018 යෙදුනු මැතිවරණ ක්‍රමයේ අනුපාතය 60:40 සිට 70:30 දක්වා වෙනස් කරමින් ඌන පූරණ ආසන සංරචකය දැනට පවතින 40% සිට 30% ට අඩු කිරීම
- යම් පක්ෂයකට එල්ලෙන ආසන ලබා දිය යුතු නම් ඒවා අනෙකුත් පක්ෂවලින් හිලවු කර ගැනීම
- වැඩිම ආසන ගත් පක්ෂයට ප්‍රසාද ආසන ප්‍රදානය කිරීම (සභිකයන් 20ට අඩු පළාත් පාලන ආයතන සඳහා එක් ප්‍රසාද දීමනාවක් සහ සාමාජිකයින් 20ක් හෝ වැඩි ගණනක් සිටින අය සඳහා 2ක්).

මෙම මැතිවරණ ක්‍රමය පිළිබඳ ප්‍රශ්න හා යෝජනා විශ්ලේෂණය සම්පූර්ණයෙන්ම සුදන්ත ලියනගේ මහතාගේ සහභාගීත්වයෙන් **පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන මැතිවරණ ක්‍රමය** සමානුපාතික නියෝජනය විකෘති කරමින් කේවල ප්‍රතිඵලයන්ට වැඩි බරක් දීමේ උත්සාහයම වේ. අවුරුද්දක කාලයක් තිස්සේ කාරක සභා රැස්වීම් මාලාවකට වියදම් කරමින් රටවැසි අපගේත් අදහස් උදහස් විමසීමෙන් පසු එහි ප්‍රතිඵලය පක්ෂග්‍රාහී මෙන්ම සාවද්‍ය වාර්තාවක් ලෙස හැඳින්විය හැකි **පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වාර්තාවම වෙනත් විධියකින් ඉදිරි පත් කිරීම අපට කිසි සේත් අනුමත කළ නොහැක.**

ඇත්තෙන්ම කේවල ක්‍රමයට වඩා බර වූ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් වන මිශ්‍ර මන්ත්‍රී බහුතර ක්‍රමය අසල්වැසි නේපාලය වැනි රටවල ක්‍රියාත්මක වේ. එවැන්නක් ගැන සාකච්ඡාවක් තාක්ෂණික කමිටුව මගින් මෙහෙයුවේ නම් එය වඩා අවංක මෙන්ම වඩා ඵලදායී ක්‍රියාවලියක් වනු ඇත.

අප මෙම සටහනේ අරමුණ මැතිවරණ ප්‍රතිසංස්කරණ සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ තාක්ෂණික කමිටු වාර්තාව මිශ්‍ර මන්ත්‍රී ක්‍රමය පිළිබඳ ජනප්‍රිය දූර්මත මුවාවෙන් සමානුපාතික නියෝජනය විකෘති කිරීමට සූත්‍ර සමීකරණ එහාට මෙහාට කිරීමේ උත්සාහයක් ලෙස පෙන්වා දීමත්, ඒ වෙනුවට පළාත් පාලනයේ දැවෙන ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කර ඒවාට විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමයි.

මෙම විශ්ලේෂණය සඳහා 2015-2019 කාලය තුල සුජාතා ගමගේ මහත්මිය විසින් පක්ෂ භේදයකින් තොරව ප්‍රධාන මෙන්ම කුඩා දේශපාලන පක්ෂ වලටත් මැතිවරණ කොමිෂන් සභාවටත් පෙර මැතිවරණ ප්‍රතිඵල මත පදනම්වූ විශ්ලේෂණ මෙන්ම, එම කාලය තුලම පාර්ලිමේන්තු ව්‍යවස්ථා සභාව සඳහා පාර්ලිමේන්තුවේ කුඩා පක්ෂ වල එකතුවේ මැතිවරණ ක්‍රම පිළිබඳ උපදේශකයෙකු ලෙස ලබා ගත් අත්දැකීම් හා 2020 වසරේ සිට සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයේ සක්‍රිය සාමාජිකයකු ලෙස මෙහෙයවීමට යෙදුනු මැතිවරණ ක්‍රම පිළිබඳ කතිකා මාලවකින් ලැබුණු තොරතුරුද යොදා ගෙන ඇත.

## 2018 පළාත් පාලන මැතිවරණයේදී යෙදුනු මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමය හඳුනා ගනිමු

1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දී 2018 පළාත් පාලන මැතිවරණ තෙක් පැවතුනු සියලු මැතිවරණ වල පදනම එක් එක් පක්ෂයට ලැබුණු ඡන්ද ප්‍රමාණය අනුව පක්ෂ අතර ආසන බෙදා දී, දෙවනුව එම ආසන වලට පුද්ගලයින් තෝරා පත් කර ගැනීම සඳහා එක් එක් අපේක්ෂකයාට ලැබුණු මනාප ඡන්ද යොදා ගැනීමයි.

2018 පැවැත්වුණු පළාත් පාලන මැතිවරණ සඳහා යොදා ගත් මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමය මූලිකවම සමානුපාත ක්‍රමයක් නමුත් එය තුලින් අපේක්ෂකයින් තෝරා පත් කිරීම සඳහා මනාප ක්‍රමයට විකල්පයක් හඳුනා දෙයි. එහිදී සභිකයින්ගෙන් 60% පත් කරගැනීම සඳහා කේවල ක්‍රමයට කොට්ඨාස මට්ටමෙන් මැතිවරණය පවත්වා එක චන්දයකින් හෝ දිනන අපේක්ෂකයින් අනිවාර්යෙන් සභිකයින් ලෙස තෝරා ගනී . ඉතුරු ආසන 40% සඳහා පක්ෂ ලේකම් විසින් නාම යෝජනා පත්‍රය සමග ඉදිරිපත් කළ අමතර අපේක්ෂක ලැයිස්තුවෙන් සභිකයින් තෝරා පත් කර එවයි.

උදාහරණ ලෙස බදුල්ල මහා නගර සභාවේ මුළු ආසන ගණන 25 කි. 2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල අනුව සමානුපාත ක්‍රමයට එම සභාවේ ආසන විසිපහ 9,8,5,3 ලෙස එජාපය, පොදු ජන පෙරමුණ, එක්සත් ජනතා නිදහස් සන්ධානය හා ජනතා විමුක්ති පෙරමුණ යන පක්ෂ අතර බෙදුණි. එම ආසන විසිපහෙන් සියයට හැටක් හෝ පහළොවක් කොට්ඨාස ආසන වේ. අමතර ආසන හෝ ඌන පූරණ ආසන ගණන දහයකි. කොට්ඨාස මට්ටමෙන් කේවල ක්‍රමයට එජාපයට ආසන නමයකුත් පොදු ජන පෙරමුණට හයකුත් හිමිවී 9,6,0,0 ලෙස කොට්ඨාස ආසන පහළොව පක්ෂ හතර අතර බෙදිණි. එසේ එක් එක් පක්ෂයෙන් තේරුණු කොට්ඨාස අපේක්ෂකයින් ගණන එම පක්ෂ වලට සමානුපාතිකව හිමි ආසන ගණනට වඩා අඩු නිසා ඉතිරි අමතර ආසන දහය 0, 2, 5,3 ලෙස පක්ෂ හතර බෙදී අතර බෙදී ඒවාට පක්ෂ ලැයිස්තුවලින් සභිකයින් තෝරා පත් කර යැවිණි. 2017 පළාත් පාලන මැතිවරණ පනතෙන් අපේක්ෂිත ලෙස සභාවේ අවසන් සංයුතිය ලැබිය හැකි ආසන්නම සමානුපාතික ප්‍රතිඵලය වන 9,8,5,3 ලෙසම විය.

(මෙහිදී එජාපය ආධාරකරුවන් විසින් තමන් කේවල ක්‍රමයට කොට්ඨාස දොළහෙන් නමයක් ජයග්‍රහණය කළ නිසා එම ‘දිනන’ පක්ෂයට සභාවේ ආසන බහුතරයක්ද හිමි විය යුතු යයි සිතන්නේ නම් ඔවුන් ඇත්තෙන්ම ඉල්ලා සිටින්නේ පැරණි කේවල චන්ද ක්‍රමයයි.)

අපේක්ෂකයන්ගේ හෝ පාක්ෂිකයන්ගේ දූර්මතය කෙසේ වෙතත් බදුල්ල මහා නගර සභාවේ ප්‍රතිඵලය මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමය සරල හෝ පිරිසිදු ලෙස ක්‍රියාත්මක් වුන අවස්ථාවකි. නමුත් සෑම විටම මෙසේ පිරිසුදු ප්‍රතිපලයක් නොලැබේ.

උදාහරණ ලෙස, කෝට්ටේ මහ නගර සභාවේ සභාවට ලබා දී ඇති ආසන තිස් පහෙන් එක් එක් පක්ෂයට ලැබුණු ඡන්ද අනුව පොදු ජන පෙරමුණට ආසන පහළොවක්ද, එක්සත් ජාතික පක්ෂයට ආසන දොළහක්ද, ජනතා විමුක්ති පෙරමුණට ආසන තුනක්ද, හතරවන පක්ෂයකට ආසන දෙකක් ද සමානුපාතිකව හිමිවිය.

නමුත් කොට්ඨාස මට්ටමෙන් කේවල ක්‍රමයට 41% ක් වැනි චන්ද ප්‍රමාණයක් ලබා පොදු ජන පෙරමුණෙන් අපේක්ෂකයින් විසින් කොට්ඨාස 21 න් 18ක්ම කේවල ක්‍රමයට දිනා ගන්නා ලදී. එම ආසන ගණන පොදු ජන පෙරමුණට සමානුපාතිකව හිමි ගණනට වඩා තුනකින් වැඩි නිසා එම පක්ෂයට අමතර ‘එල්ලෙන ආසන’ තුනක් ලබා දීමට සිදු විය. 2018 ක්‍රියාත්මක වුනු ආකාරයට මෙම එල්ලෙන ආසන සඳහා සභාවේ අමතර ආසන පැනවූ නිසා අවසන් සභික ධූර ගණන 38 දක්වා වැඩිවුණි. මැතිවරණ කොමිසමේ තොරතුරු වලට අනුව 2018 පළාත් පාලන මැතිවරණයේදී මවැනි එල්ලෙන ආසන 365ක් සඳහා අමතර අසුන් පැනවීම නිසා රටේ මුළු සභික සංඛ්‍යාව නියමිත 8346 සිට 8719 තෙක් 4% කින් වැඩි විය. මෙම වැඩි වීම සැබවින්ම මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ එක් දූර්වලතාවයක් වුවත් එය සැලකිය යුතු වැඩි වීමක් නොවේ.

මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ තවත් දූර්වලතාවක් වන්නේ දේශපාලන රැල්ලට එකම පක්ෂය එක චන්දයකින් හෝ කොට්ඨාස සියල්ලම වාගේ දිනන තත්වයක් තුල අනු ශූර පක්ෂ වලට සභිකයින් පත් කිරීමට සිදු වන්නේ පක්ෂ ලැයිස්තු වලින් පමණක්ම වීමය.

තුන්වෙනුව, කාන්තා හෝ සුළු ජන නියෝජනය සහතික කිරීමට යම් කෝටාවක් නිශ්චිත කර ඇති විට වැඩිම චන්ද ලබන පක්ෂයට ලැයිස්තු ආසන නොලැබීම නිසා එම කෝටාව සපුරාලීමට සිදුවන්නේ අනු ශූර පක්ෂ වලට හිමි ආසන තුලින් පමණය. උදාහරණ ලෙස කෝට්ටේ මහ නගර සභාවේ පොදු ජන පෙරමුණේ කොට්ඨාස මට්ටමේ අපේක්ෂයින් දහඅටෙන් තුන්දෙනෙක් කාන්තාවන් විය, ඔවුන්ගෙන් දෙදෙනෙක් ජයග්‍රහණය කළත් පොදු ජන පෙරමුණට අමතර ආසන හිමි නොවීම නිසා එම පක්ෂයෙන් කාන්තා නියෝජනයට දායකත්වය 18 න් දෙකක් හෝ 11% කට සීමා විය. මුළු කාන්තා නියෝජනය 25% ට ගෙන ඒමට වැඩි දායකත්වයක් සපයන්නට සිදු වූයේ අනුශූර පක්ෂ වලටය.

ඇත්තෙන්ම කාන්තා නියෝජනය ප්‍රශ්නයට සූත්‍ර සමීකරණ වෙනස්කම් තුලින් යම් විසඳුම් ලබා දිය හැක.උදාහරණයක් ලෙස කොට්ඨාස මට්ටමේ කාන්තා අපේක්ෂක කෝටාව දැනට නියමිත 10% සිට 20%ට වැඩි කිරීමට තාක්ෂණික කමිටුවේ යෝජනා කර ඇත. එය වැඩි වීම වූවත් සෑහේද යන්න සලකා බැලිය යුතුව ඇත. නමුත් තාක්ෂණික කමිටුව වැඩි බරක් දෙන්නේ සූත්‍ර සමීකරණ හරහා අනු ශූර පක්ෂ වල කොටස අඩු කර දේශපාලන ප්‍රශ්න විසඳීමටය. අනු ශූර පක්ෂ වල කොටස අඩු වන විට ඉතා පැහැදිලිවම 25% ක අවම කාන්තා නියෝජනය සහතික කළ නොහැකි වනු ඇත.

**සභික සංඛ්‍යාව වැඩි වීම මැතිවරණ ක්‍රමයේ ප්‍රශ්නයක් නොවේ.**

සමහරුන් පෙන්වා දෙන්න පරිදි 1987 ප්‍රාදේශීය සභා පනතට පෙර පැවති ගම් සභා, සුළු නගර සභා, නගර සභා හා මහ නගර සභා පද්ධතිය තුළ 9000 කට අධික සභිකයින් ගණනක් පැවතී ඇත. අලුත් පනත යටතේ නිර්ණය කරන ලදුව, උදාහරණ ලෙස, 2013 දී පළාත් පාලන ආයතන වලට පත්වූ සභිකයින් 4386 හා සසඳන විට 2018 පත්වූ සභිකයින් ගණන 8719 ලෙස දෙගුණයකට වඩා වූ බව ඇත්තය.

නමුත් ප්‍රශ්නයට ආරම්භක හේතුව වන්නේ 2014 සීමා නිර්ණය කමිටුව විසින් පළාත් පාලන කොට්ඨාස ගණන 4919 හා කොට්ඨාස මන්ත්‍රී ධූර 5092 ක් ලෙස නිශ්චය කිරීමයි. මෙයට බොහෝ විට හේතුව එවකට සිටි සභිකයින් 4386 ටම හෝ වැඩි ගණනකට ආසනයකට තරග කිරීමේ අවස්ථාව ලබා දීම විය හැක. නමුත් එවකට වලංගු 2012 අංක 22 දරන පළාත් පාලන මැතිවරණ පනතට අනුව අමතර මන්ත්‍රී ධූර ගණන කොට්ඨාස මන්ත්‍රී ධූර ගණනින් 30% ක් පමණක් වූ නිසා මුළු මන්ත්‍රී ගණන 6623 කට සීමා විය.

2015 දී පත්වූ යහ පාලන රජය විසින් නීති ගත කරන ලද 2016 අංක 1 දරන මැතිවරණ සංශෝධන පනත තුලින් අමතර මන්ත්‍රී ධූර ගණන කොට්ඨාස මන්ත්‍රී ධූර ගණනින් 67% වන ලෙස හෝ එම අනුපාතය 60:40 වන ලෙස වෙනස් කරමින් පළාත් පාලන මැතිවරණ ක්‍රමය මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමයකට වෙනස් කිරීම ප්‍රගතිශීලී පියවරක් වුවත් එම නිසා මුළු මන්ත්‍රී ධූර ගණන 8334 ක් ලෙස වැඩි විය. ඇත්තටම එම රජය විසින් කළ යුතුව තිබුනේ පළාත් පාලන ආයතන වලට අවශ්‍ය හෝ දැරිය හැකි මන්ත්‍රී ධූර සංඛ්‍යාව පිළිබඳව යම් නිර්ණයක් කර එයින් 60% ක් වනසේ කොට්ඨාස මන්ත්‍රීධූර ගණන තීරණය කර නව සීමා නිර්ණයක් කිරීමයි. ඒ අවස්ථාවේ සිවිල් සමාජය වුවද එම ඉහළ නැගුනු මන්ත්‍රී ධූර ගණන පිළිබඳව හඬක් නොනැගීමද කණගාටුවට කරුණකි.

2014 සීමා නිර්ණයෙදී කොට්ඨාසයක පැවතිය යුතු ජනගහනය පිලිබඳ මිම්මක් තිබුණු බව නොපෙනේ. සමහර කොට්ඨාස වලට සිය ගනනක් පමණක් අයත් වන විට තව කොට්ඨාස වලට දහස් ගණන් අයිති වන අවස්ථා ඇත. සමහර විට වඩා කුඩා කොට්ඨාස එක් කරමින් කොට්ඨාසයකට සොටිය යුතු ජනගහනය කරමින් යම් ප්‍රමිතියක් ඇති කරමින් කොට්ඨාස ගණන හා ඒ තුලින් සභික ගණන අඩු කළ හැක. ඇත්තෙන්ම සිදු විය යුත්තේ, පළාත් සභා පනතේ දැක්වෙන ලෙස කොට්ඨාසයක ජනගහනයක් සඳහා අවම නියෝජනයක් නිශ්චය කර නැවත සීමා නිර්ණයක් කිරීමය. නමුත් 2022 සඳහා නියමිත පළාත් පාලන මැතිවරණයට පෙර නව සීමා නිර්ණයක් කළ හැකිද යන්න සැක සහිතය.

## ස්ථාවරත්වය පිළිබඳ 'ප්‍රශ්නය' අළුත් ප්‍රශ්නයක් නොවේ.

යම් පක්ෂයකට සභාවේ බහුතර ආසන ගණනක් දින ගැනීමට නොහැකි වීම සමානුපාත ඡන්ද ක්‍රමයේ ලක්ෂණයකි. එම නිසාම පළාත් පාලන පනත් සංශෝදනයක් මගින් අයවැය සම්මත කර ගැනීමේදී සභාපතිවරයාව අහේතුකව පැරද්ද වීමේ උත්සාහයන් වලකා ඔහුට හෝ ඇයට අවුරුද දෙකක යම් ස්ථාවරත්වයක් ලබා දී ඇත.

2018 පළාත් පාලන මැතිවරනයේද යම් එක් පක්ෂයකට සභාවක ආසන වලින් සියයට පනහකට වඩා ලබා ගැනීමට නොහැකි වූයේ මැතිවරණ ක්‍රමය නිසා නොව දේශපාලන තත්වය නිසයි.

උදාහරණ ලෙස, 2018 මැතිවරණයේදී සමස්තයක් ලෙස ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ (**SLPP**) 46.65% ක් ඡන්ද ලබා පළාත් ආයතන බොහොමයක වැඩිම චන්ද ලබන පක්ෂය වුවත් බොහොමයක් සභා වල සමානුපාතිකව ඔවුනට ලැබුණු ආසන ගණන 50% ට අඩුය. නමුත් එම පක්ෂය විසින් කේවල ක්‍රමයට එක චන්දයකින් හෝ කොට්ඨාස සියල්ලම හෝ සියලු හෝ වැඩි හරියක් දිනීම නිසා නිසා ඔවුන්ට සභාවේ වැඩි ආසන ගණනක් හිමි විය යුතුය යන දුර්මතය ජනතාව අතර මෙන්ම දේශපාලන නායකයින්ද අතරද පවතී. නමුත් මුළු චන්ද ගණනින් හෝ ආසන වලින් පොදු ජන පෙරමුණට 50% ට වඩා ලබානොහැකි වූයේ මිශ්‍ර මැතිවරණ ක්‍රමය නිසා නොව නොව දේශපාලන බෙදීම් නිසා බව පැහැදිලිය.

2018 පළාත් පාලන මැතිවරණයේදී ලෙස ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ (**SLPP**) 46.65% ක් ඡන්ද ලබා ගණිද්දී එක්සත් ජනතා නිදහස් සන්ධානය (**UPFA**) හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පිළිවෙලින් ඡන්ද 8.94% ක් 4.44% ලබා ගන්නා ලදී. එම පක්ෂ හෝ සන්ධාන තුන ලැබූ ඡන්ද එකතු කල විට 58.03% ඡන්ද ප්‍රතිශතයක් ඇත. ඇත්තෙන්ම මේ කණ්ඩායම් තුනම මීට පෙර **UPFA** ලෙස සන්ධාන ගතව තරග කල අයවලුන්ගෙන් සමන්විත නිසා, පොදුජන පෙරමුණට බහුතරයක් ලබා ගැනීමට නොහැකි වීමට හේතුව සමාන දේශපාලන මතවාදයක් තුන් අතකට බෙදීම මිස මැතිවරණ ක්‍රමය නොවන බව පෙනේ. එම කරුණ ජනතාවට පැහැදිලි කිරීම වෙනුවට, කේවල ක්‍රමයට කොට්ඨාස වැඩි ගණනක් දිනූ පමණින් පක්ෂයක් ජයග්‍රහණය කරයි යන දුර්මතය ස්ථිර කරමින් එක් පක්ෂයකට කෘතිමව බහුතරයක් ලබා දීම අනුමත කළ නොහැක.

## සමානුපාත නියෝජනය විකෘත කිරීම විසඳුමක් නොවේ.

තාවකාලිකව සභික ධූර ගණන  අඩු කිරීමට විසඳුම් ලෙස ඉදිරි පත් කර ඇත්තේ ඌන පූරණ ආසන වල ප්‍රතිශතය 30% ට අඩු කිරීම හා එල්ලෙන ආසන සඳහා අමතර අමතර ආසන පනවන්නේ නැතිව එම ආසන අනු ශූර පක්ෂ වලින් හිලවු කිරීමය. අපේ ගණනයන් අනුව මේ මෙවලම් දෙක තුලින් අඩු විය හැකි උපරිම සභිකයින්  ප්‍රතිශතය ඉතා සීමිතය.

උදාහරණ ලෙස  70:30 අනුපාතයට වෙනස් කිරීම හෝ ඌන පූරණ ආසන වල ප්‍රතිශතය 30% ට අඩු කිරීම තුලින්  සභිකයින් ගණන  16% කින් අඩුවේ. ඌන පූරණ ආසන ගණන අඩු කිරීමේ යෝජනාව අස් කරගෙන ඇති බව ආරංචි වේ. මෙය වැදගත් පියවරකි. ලෝකය පුරා මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික ක්‍රමය පවතින රටවල් කිහිපය සලකා බලන විට  කේවල මට්ටමෙන් පත්වන මන්ත්‍රී ධූර සංඛ්‍යාව 50%-67% ත් අතර පවත්වා ගන්නේ[1] එක් එක් එක් රටේ චන්ද දායකයන්ගේ චන්දය පාවිච්චි කරන රටාව හා වෙනත් සමාජ  සාධක මත පදනම්වය. උදාහරණ ලෙස ජර්මනිය, හංගේරියාව, බිලිවියාව, නව සීලන්තය, මෙක්සිකෝව ලෙසොතෝ හා වෙනිසියුලාව යන රටවල මිශ්‍ර මත්රී කරාමය යෙදෙන අතර ඒවායේ කේවල් ප්‍රතිශතය පිළිවෙලින් 50%, 53%, 54%, 58%, 60%, 67% හා 68% ලෙස පවත්වා ගනී. ලංකාවේ තත්වය අනුව 70:30 අනුපාතය ඇතිවිට  කේවල ජයග්‍රහණ රැල්ලක් ඇතිවුනොත්  එල්ලෙන ආසන සංසිද්ධිය උග්‍ර  වනු ඇත.

සභික ගණන අඩු කිරීමට තාක්ෂණික කමිටුවේ අනික්  යෝජනාව  එල්ලෙන ආසන ඇතිනම් ඒවා  අනු ශූර පක්ෂ වල ආසන විස්සෙන් හිලවු කර ගැනීමය. මේ තුලින් මුළු සභික ගණන අඩු වන්නේ 365කින් හෝ 4% කිනි.  මේ පියවරල් දෙකෙන් වෙන වෙනම  හෝ එකතුවෙන් සභිකයින් ගණන අඩු කෙරෙන්නේ  20% කින් පමණි. නමුත් ඒ නිසා සමානුපාත නියෝජනයේ සිදුවන විකෘතිය පිළිබඳවද කාරක සභාව දැනුවත් කර නැති බව පෙනේ.

සමානුපාත  ගණනයට පෙර දිනන පක්ෂයට  බෝනස් ආසන වෙන් කිරීමේ  ප්‍රධාන අරමුණ වැඩිම චන්ද ප්‍රතිශතයක් ලබා ගන්නා  පක්ෂයට සභාවේ බහුතරයක් ලබා දීමයි. නමුත් කෝට්ටේ මහා නගර සභාව ගත්කල දිනන පක්ෂයට බෝනස් ආසන දෙකක් වෙන් කර දීමේ වාසිය  එම පක්ෂයටම එල්ලෙන ආසන ලැබීම නිසා නිශේධ වන අතර, බෝනස් ආසන දීම නොයෙකුත් වෙනස් වෙනස් සභා වලට බලපාන අන්දම පිළබඳ පූර්ණ අධ්‍යනයක් අවශ්‍යය.

ඇත්තෙන්ම යෝජිත වෙනස් කම් තුනෙන්ම බලාපොරත්තු වන්නේ වැඩි චන්ද සංඛ්‍යාවක් ගන්න පක්ෂයට සමානුපාතිකව හිමි ආසන ගණනට වඩා වැඩි ආසන ගණනක් ලබා දීමය. උදාහරණ ලෙස යෝජිත මෙවලම් තුනම 2018 කෝට්ටේ මහා නගරසභාවේ මැතිවරණ ප්‍රතිඵල වලට යෙදුව  විට 41.6% ක් ලබා ගත පොදු ජන පෙරමුණට ආසනවලින් 60%කට වැඩි ගණනක් හිමි වනු  හිමි වනු ඇත. අනිකුත් පක්ෂ වලට ආසන අහිමි වනු ඇත. අනිකුත් සභා වලටද  අඩු වැඩි වශයෙන් එවැනි ප්‍රතිඵලයක්  ලැබෙනු ඇත.

මෙවැනි කේවල ක්‍රමයට සියයට පනහකට අඩුවෙන් ලබන පක්ෂයකට ආසන වලින් බහුතරයක් ලබා දෙන  මැතිවරණ ක්‍රමයකට තව දුරටත් මිශ්‍ර මන්ත්‍රී සමනුපාත ක්‍රමයක්  කිව නොහැක.  එය අවංක නොවේ.

දෙවනුව පළාත් පාලනය මැතිවරණ ක්‍රමයේදී මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයට සුවිශේෂ ප්‍රශ්න මෙන්ම පළාත් පාලන ආයතන වල දැවෙන දේශපාලන සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්න වලට මේ සූත්‍ර සමීකරණ සමග කරන සෙල්ලම් වලින් විසඳුමක් නොලැබේ.
.

## මිශ්‍ර මන්ත්‍රී  ක්‍රමයේ  දැවෙන ප්‍රශ්නය ලැයිස්තුවෙන් පත්වෙන මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නයයි

පළාත්පාලන සභාවල සභික ධූර ගණන වැඩි වීම හෝ සභාවල අස්ථාවර භාවය මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ  දැවෙන ප්‍රශ්නයක් ලෙස  හැදින්වීම සාවද්‍යය. මිශ්‍ර මන්ත්‍රී  ක්‍රමයේ  දැවෙන ප්‍රශ්නය වන්නේ ශ්‍රී ලාංකිය  දේශපාලන සංස්කෘතියට  ලැයිස්තු මන්ත්‍රී ක්‍රමය ගලප්පා  ගැනීමට නොහැකි වීම හා ඒ අනුසාර ප්‍රශ්නයි.

පසු ගිය 2018 පළාත් පාලන මැතිවරණයේදී එකතුව 50% කට වැඩි  ඡන්ද ලැබෙන අනුශූර පක්ෂ වලට  බොහෝ විටම හිමිවූයේ පක්ෂ ලැයිස්තු මන්ත්‍රී ධූර පමණක් වීම හා බලයේ සිටින පක්ෂයේ සභාපති වරුන් එම මන්ත්‍රී වරුන්ට ඔවුනගේ සංවර්දන යෝජනා වලට සභාවෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම වැනි අකටයුතු සිදු වීම නිසා 50% කට වැඩි ඡන්ද දායකයින්ට නියෝජනය අහිමි ඇත.

## පළාත් පාලන දේශපාලනයේ සෙසු ප්‍රශ්න දේශපාලන සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්න වේ.

**පළාත් පාලන ආයතන වල පත්වන** බලයට පත්වන අය තමන්ගේම  පක්ෂයේ අය සමගවත් සහයෝගයෙන් වැඩ කිරීමේ හැකියාවක් නැති පුද්ගලයින් බවට උදාහරණ ඇත. යම් යම් සභාවල සභාපතිවරුන් බලයෙන් නෙරපා හැරීම් උත්සහ එම

---

[1] Country (% FPP, Total #seats): Germany (50%, 598); Hungary (53%, 199); Bolivia (54%, 130); New Zealand (58%, 120); Mexico (60%, 500); Lesotho (67%, 120); and Venezuela (68%, 165); Reservations for minorities: Venezuela, 6 and New Zealand, 3. https://aceproject.org/ace-en/topics/es/esd/esd05

පක්ෂයේ අයම විසින් කරන බව රහසක් නොවේ. එම නිසා වගකිවයුතු පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් මේ අවස්ථාවේ කළ යුතු වන්නේ රටේ දේශපාලන සංස්කෘතිය යම් සාධනීය දිශානතියකට ගෙන යෑම සඳහා අවශ්‍ය වෙනස් කම් කිරීමය.

## 2022 නියමිත පළාත් පාලන මැතිවරණය සඳහා වහාම කළ යුතු වෙනස්කම්

1. නිසි අධ්‍යනයක් නොමැතිව කෙරෙන සූත්‍ර සමීකරණ සෙල්ලම් නවතා 2017 පළාත් පාලන පනත ඉදිරි පළාත් පාලන මැතිවරණය සඳහා එලෙසම ක්‍රියාත්මක කරන්න.
2. යම් තරමකට හෝ සුදුසු පුද්ගලයින් පළාත් පාලන ආයතන වලට තේරී පත් කර ගැනීමට වහාම පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කරන්න.
   - අපේක්ෂකයින්ගේ අධ්‍යාපනය, පළපුරුද්ද, වත්කම් සහ බැරකම්, සහ අපරාධ වාර්තා තිබේ නම් ඒවාත් ඇතුළු ජීව දත්ත නාම යෝජනා බාර දුන් වහාම මහජනතාවගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධියට පත් කිරීම
   - පළාත් පාලන ආයතන මැතිවරණ පනතට අතුරු මැතිවරණ ප්‍රතිපාදන හඳුන්වා දීම. එනම් කේවල ක්‍රමයට තේරී පත් වූ මන්ත්‍රීවරයෙකු මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් වරදකරු වුවහොත් ඔහුගේ/ඇයගේ ආසනය අහිමි කර අතුරු මැතිවරණයක් පැවැත්වීම අනිවාර්ය කිරීම.
   - පළාත් පාලන ආයතන සඳහා 25% ක කාන්තා නියෝජනය සහතික කිරීම හා එම නියෝජනය සාධාරණ හා වැඩ එලදායී ලෙස සිදුවීම සඳහා සෑම පක්ෂයකින්ම එම නියෝජනය ලබා දීමට අවශ්‍ය ලෙස කොට්ඨාස මට්ටමෙන් ඉදිරිපත්විය යුතු කාන්තා අපේක්ෂක ප්‍රතිශතය 30% ට හෝ ඊට වැඩි ගණනකින් වැඩි කිරීම.
3. ලැයිස්තු වලින් පත්වන මන්ත්‍රී වරුන් නියෝජනය කරන පඛ වලට හා ජනතාවට සිදුවන අසාධාරණය නැති කිරීම සඳහා කොට්ඨාස වලින් පත්වන මන්ත්‍රී වරුන්ට සම තැන ලබාදී ඔවුනගේ සංවර්ධන යෝජනා වලට සභාවේ මුදල් වලින් 30% හෝ 40% වෙන් කිරීම් අනිවාර්ය කිරීම (මෙය අදාළ පළාත් පාලන පනත යටතේ සිදු කළ යුත්තකි.)
4. 2026 මැතිවරණය සඳහා අපක්ෂපාතී හා විද්‍යාත්මක තීරණයක් ගැනීම සඳහා මැතිවරණ ක්‍රම පිළිබඳ දැනුම හා අවශ්‍ය දත්ත විශ්ලේෂණය සඳහා හැකියාව ඇති දෙස් විදෙස් විශේෂඥයින්ගෙන් සැදුනු තාක්ෂණික කමිටුවක සහාය ලබා ගන්න.

## වත්මන් තාක්ෂණික කමිටුවට ප්‍රශ්න කිහිපයක්

සාමස්යක් තාක්ෂණ කමිටුවේ යෝජනා එක එක ගත්තත් එකට ගත්තත් වැරසඳහන් ප්‍රශ්න වලට විසඳුම් ලබා දීම අවසන් ප්‍රතිඵලය අනු ශූර පක්ෂ වලට ඡන්දය දුන් අයට නියෝජනය අහිමි කිරීමයි. කාන්තා නියෝජනය ලබා දීම තව දුරටත් දුෂ්කර කිරීමයි.

කාරක සභාව විසින් තාක්ෂණික කමිටුවෙන් ඇසිය යුතු ප්‍රශ්න කිහිපයකි.

1. පළාත් පාලන ආයතන වල සභික සංඛ්‍යාව 16% කින් අඩු කිරීමට අඩු කිරීම මැතිවරණ සමීකරණය වෙනස් කිරීම වග කීම් රහිත්අ යෝජනාවක් නොවේද? සභාවක සිටිය යුතු ප්‍රශස්ත සභික සංඛ්‍යාව පිළිබඳ තාක්ෂණික කමිටුව විසින් අධ්‍යනයක් කලාද?

2. පළාත් පාලන ආයතන වල ස්ථාවර භාවයද සමීකරණ සූත්‍ර වෙනස් කම් වලින් කළ හැකිද? එය දේශපාලන විසඳුම් ලබා ගත යුතුහ් දේශපාලන ප්‍රශ්න නොවේද?

3. මේ යෝජනා වලින් සමානුපාතය කොතරම දුරට විකෘත වන්නේද යන්න ගැන පාර්ලිමේන්තු කාරක සභාව දැනුවත්ද? තම යෝජනා පළාත් පාලන ආයතන 341 ප්‍රතිඵලයට බල පෑම පිළිබඳව විශ්ලේශාන්යක් ලබා දීම කමිටුවේ වගකීම නොවීඩ්?

4. විශේෂයෙන්ම මේ යෝජනා වලින් කාන්තා නියෝජනය 25% ක් වීම සහතික නොකළ හැකි බවට පාර්ලිමේන්තු කාරක සභාව දැනුවත්ද?

5. මෙසේ සමානුපාත නියෝජනය විකෘති කරන්නේ පළාත් පාලනයේ ඇවෙන ප්‍රශ්න හරි හැටි හඳුනාගෙනද?